# සමුපකාර සංකල්පයට පදනම් වූ ඓතිහාසික පසුබිම

සමුපකාර ව්‍යාපාරය සහ සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර ව්‍යාපාරය (සණස) යන ක්ෂේත්‍රයන් මූලික සංකල්ප දෙකක් මත පදනම් වේ. එනම් සමුපකාරය ව්‍යාපාරය "සමුපකාරය" යන සංකල්ප තුලද සණස ව්‍යාපාරය "සකසුරුවම" යන සංකල්පය මත පදනම්ව ක්‍රියාකරනු ලැබේ. එබැවින් මෙම සංකල්පයන්ගේ ආරම්භය ඈත අතීතයේ සිට පැවතෙන්නක් බව ප්‍රකාශ කළ හැකි වේ.

සමුපකාරය වූ කලී පුළුල් මෙන්ම ගැඹුරු මානව හිතවාදී දර්ශනයක් සහිත ව්‍යාපාරයකි. මෙම අදහස මත සිට "සමුපකාරය" යන්නෙහි අර්ථයට අවධානය යොමු කිරීමේදී එහි ගැඹුරු සහ පුළුල් අර්ථයක් ඇති බව පෙණේ. සමුපකාරය යන වචනය විසන්ධිකර බැලීමේදී සංවිධානාත්මකව හා අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකාට උපකාර කර ගැනීම යන අර්ථය එහි අන්තර්ගතව ඇති අයුරු පැහැදිලි වේ. සමුපකාරය යන්නට ඉංග්‍රීසි වචනය (Co-operation) යන්නයි. Co-operation යන්න ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය අර්ථ දක්වන්නේ එකම අරමුණක් සඳහා සාමූහිකව කටයුතු කිරීම වශයෙනි. මෙලෙස සමුපකාරය යන්නෙහි සාමාන්‍ය අර්ථය එකිනෙකාට උපකාර කර ගැනීම යනුවෙන් හඳුනාගත හැකි නමුත් සමුපකාර ව්‍යාපාරය සමස්ථයක් වශයෙන් ගෙන අධ්‍යයන කිරීමේදී එහි ගැඹුරු අර්ථයක් ඇතිබව කිව යුතුය.

"සකසුරුවම" යන සංකල්පය සණස සමිති ව්‍යාපාරයේ අන්තර්ගතව ඇති ප්‍රධාන තේමාවකි. සකසුරුවම නැමති සංකල්පය උකහා ගැනීමේදී එය ඈත අතීතයේ සිටම පැවති තත්වයන් තුළින් වර්ධනය වූ පසුබිමක් මත පදනම් විය. "සමුපකාරය" සහ "සකසුරුවම" යන සංකල්ප දෙක පදනම්වීමට ඓතිහාසිකව උපකාර් වූ පදනම අධ්‍යයනය කිරීමේදී ඒවා වෙන්ව ගෙන විශ්ලේෂණය කිරීම වැදගත් වේ.

සකසුරුවම් හා ණයගනුදෙනු පිළිබඳ සමුපකාර ක්‍රමයේ (සණස) මූලික සිද්ධාන්තය වන්නේ "සකසුරුවම" නැමති සංකල්පය වේ. මානව ක්‍රියාකාරත්වයේ සෑම අවස්ථාවක් තුළම මෙම ලක්ෂණය ගැබ්ව තිබුණි. බුදුන්වහන්සේගේ දර්ශනය තුළ පවා විශේෂයෙන් ආර්ථික ක්ෂේත්‍රය පදනම්කරගනිමින් සකසුරුවම අන්තර්ගතව පැවතුණි. ව්‍යග්ග පජ්ජ සූත්‍රය ගැන අවධානය යොමු කිරීමේදී ඒ පිළිබඳව මෙසේ විග්‍රහ කර ඇත.

"ඒකේන භෝගෙන භුන්ජෙය්‍ය
ද්විහි කම්මං පයෝජයෙ
චතුත්ථංච නිදාපෙය්‍ය
ආපදාසු භවිස්සති"

තමන් උපයන ආදායම කොටස් හතරකට බෙදා පළමු කොටස තම දෛනික ජීවිතයේ පරිභෝජනයටත් ඉතිරි කොටස් තුනෙන් කොටස් දෙකක් තම ව්‍යාපාර දියුණුකර ගැනීම සඳහාද ඉතිරි කොටස ආපදාවකදී ගැනීම සඳහා අරපරෙස්සමෙන් ඉතිරි කළ යුතු බව සඳහන් වේ. මේ තුළින් අවබෝධ වන්නේ මිනිස් දිවිය තුළ ආර්ථික කටයුතු ක්‍රියාත්මක වීමේදී "සකසුරුවම" නැමැති සංකල්පය සඳහා වැදගත් තැනක් හිමිව ඇති බවයි.

ලංකාවේ ආර්ය ජනපද පිහිටුවීම නිසා මෙරට ආර්ථිකය කෘෂිකාර්මික ස්වරූපයක් ගනු ලැබිය. ක්‍රි. පූ. 6 වන සියවසේ ආර්ය නායකයින් පිහිටවන ලද ගම් කිහිපයක් විය. මෙලෙස ලක්දිව මුලින් පදිංචි වූ ආර්යයන් තම ජීවනෝපාය සඳහා අන්‍යෝන්‍ය සහයෝගයෙන් කටයුතු කිරීමට, පුද්ගලිකව තම තමන්ගේ ආර්ථික තත්වය දියුණු කර ගැනීමට සාමූහිකව ආර්ථික දියුණුව ඇතිකර ගැනීමට හැකිවිය. ඔවුන් විසින් කෘෂි කාර්මික ජීවිතයක් ගත කිරීමේදී එකිනෙක මත පරායත්තව කටයුතු කිරීමට සිදුව ඇත. සිය කෘෂි කාර්මික කටයුතු ඉටුකර ගැනීමේදී සියළු කාර්යයන් පෞද්ගලිකව කරගත නොහැකි වූ බැවින් ඒවා සාමූහික ප්‍රයත්නයක් තුළින් මෙහෙයවා ගත් ආකාරයක් දිස්වෙයි. එම කටයුතු සඳහා ජලය ලබා

***බුදුන්වහන්සේගේ දර්ශනය තුළ පවා විශේෂයෙන් ආර්ථික ක්ෂේත්‍රය පදනම්කරගනිමින් සකසුරුවම අන්තර්ගතව පැවතුණි. ව්‍යග්ග පජ්ජ සූත්‍රය ගැන අවධානය යොමු කිරීමේදී ඒ පිළිබඳව විග්‍රහ කර ඇත.***

ගැනීමේදී අන්‍යෝන්‍ය සුහදත්වය මත කටයුතු කිරීමට සිදු වේ. වසරින් කෙටි කලක් මෝසම් වැසි ලැබුණු ප්‍රදේශවල වර්ෂය පුරා ගොවිතැන් කිරීමට අවශ්‍ය ජලය ලබා ගැනීමේදී අන්‍යෝන්‍ය සුහදත්වය මත කටයුතු කිරීමට සිදුවිය. වසරින් කෙටි කලක් මෝසම් වැසි ලැබුණු ප්‍රදේශ

**ගෝත්‍රික අවශ්‍යතා ඉටුකර ගැනීමට සාමූහිකව ඒකරාශි වී කටයුතු කළ බව පෙනේ. පැරණි ගෝත්‍රික සමාජ ක්‍රමය තුළ පැවතුනේ සාමූහික චින්තන ක්‍රමයකි. ගෝත්‍රයේ පැවැත්මටත්, ආරක්ෂාව සපයා ගැනීමටත්, එකිනෙකාගේ සහයෝගය උදව් අවශ්‍ය විය. එය ඉපැරණි සමුපකාර සමාජය වූයේය.**

වල වර්ෂය පුරා ගොවිතැන් සිදුකිරීමට අවශ්‍ය ජලය රැස්කර ගැනීම පැරණි ලාංකිකයන් මුහුණ පෑ ප්‍රබල ගැටළුවක් විය. මෙම ගැටළුව ජය ගැනීමට ගත් උත්සායක් ලෙස ඔවුහු ගංගා හරස් කර වැව් තනා ජලය රැස්කර ගැනීමට කටයුතු කළහ. මේ තුළින් ජලය නොමැති වකවානුව තුළ ජලය ලබා ගැනීමට හැකි වූ අතර එය පදනම් කරගෙන දෛනික කටයුතු ආශ්‍රයෙන් සකසුරුවමට පුරුදු විය.

ලාංකික ගොවි සමාජය සකසුරුවම පිළිබඳ සංකල්පය තුළ අන්තර්ගතව පැවතුණි. සහයෝගය, සහජීවනය සමගින් අගය කරන දේශීය ගොවියා අස්වනු නෙලීමේදී මෙම කටයුතු "අත්තම්" ක්‍රමයට කරන ලදී. ගොයම් කැපීමේදී මුළු ගමේම ගොවියෝ සාමූහිකව වැඩ කරන අතර එක් එක් ගොවියාගේ ගොයම් කැපීමට පැමිණෙති. වෙල් යායේම ගොයම් කැපීම අවසන් වනතුරු සාමූහිකව වැඩ කරති. වී වගාවේදී එක කන්නයක් වගා කර එයින් ලබන අස්වැන්නෙන් කොටසක් තැන්පත් කරන අතර එය තබනු ලබන්නේ "වී බිස්ස" නම් ගබඩාවකයි. මේ තුළින් පෙනී යන්නේ එලෙස වී තැන්පත් කිරීම අනාගත සුරක්ෂිතභාවය ඇතිවීම උදෙසා ඉවහල් වන්නට ඇත. මේ සඳහා ඔවුන්ට උපකාර වන්නට ඇත්තේ සකසුරුවම නැමැති සංකල්පය විය හැකිය.

කෘෂි කාර්මික කටයුතු හැරුණු විට, විශේෂයෙන් ගෘහස්ත කටයුතු වලදීද සකසුරුවම නැමැති ලක්ෂණය දක්නට ඇත. විශේෂයෙන් කාන්තාවගේ ගෘහස්ත කටයුතුවලදී මෙය නිතරම විද්‍යාමාන වේ. සෑම ගෙදරකම ගෘහනිය වෙත පිසීමට සහල් ගන්නා විට එයින් එක් මිටක් ගෙන වෙනත් බඳුනක තැන්පත් කරයි. දිනපතා දෙමිට බැගින් එකතුවන සහල් ඇති වූ විට එම මුට්ටිය "මුට්ටි හාල්" ක්‍රමය ලෙස රොබට් නොක්ස් විසින් හඳුන්වා ඇත. මෙලෙස තැන්පත් කරන සහල් හදිසි අවස්ථාවකදී ගැනීමටත් අසරණයින් හට පරිත්‍යාග කිරීමටත් හැකිවිය. ඒ අනුව පෙනී යන්නේ අන් අයට පරිත්‍යාග කිරීමටත් ජීවත්වන ගමන් යමක් ඉතිරි කර ගැනීමට උත්සාහ ගත් බවකි. මූල්‍ය කටයුතු වලදී එදිනෙදා භාවිතයේදී අතිරික්තව ඉතිරි වන මුදල් සකසුරුවම්ව පරිහරනය කිරීමට ක්‍රියා කොට ඇත.

සකසුරුවමට හුරුවූ ජනයා සමාජ විකාශනයේදී අතීතයේ සිටම අන්‍යෝන්‍ය උපකාරය තුළින් සම්බන්ධතාවයකින් යුක්තව ක්‍රියා කරන ලදී. ආර්ථික මෙන්ම සමාජ කටයුතු වලදී "සකසුරුවම" නැමති සංකල්පය පදනම් කරගෙන සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිති ක්‍රමය (සණස) බිහි වන්නේ නූතන අවධියේදීය.

සමුපකාර ව්‍යාපාරයෙහි "සමුපකාරය" නැමැති සංකල්පය විග්‍රහ කර බැලීමේදී "සාමූහිකත්වය" මෙම ක්‍රමයේ මූලික ලක්ෂණයකි. මානව ක්‍රියාකාරීත්වයේ සෑම ක්‍රියාවක් තුළම මෙම සංකල්පය ගැබ්ව පවතී. ඒ අනුව නූතන සමුපකාර සංකල්පය බිහිවීමට පෙර ලෝක පසුතලය සමුපකාර සංකල්පය විවිධ අයුරින් ක්‍රියාත්මක වූ බව සිතිය හැකිය. මිනිසාගේ පරිණාමය සිදුවීමට පෙර සිටම සතුන් අතර සාමූහිකව ජීවත් වීමේ ක්‍රම පැවති බව සිතිය හැකිය. එමෙන්ම මිනිසා ක්‍රමයෙන් ශිෂ්ටත්වයට පැමිණි අවධියේ සාමූහිකත්ව සංකල්පය ක්‍රමයෙන් වර්ධනය විය. ක්‍රි. පූ. අවධියේ සිටම එනම් මෙසපොතේමියානු, බැබිලෝනියානු ශිෂ්ටාචාරවලද සාමූහිකත්ව සංකල්පය පැවති බවට සාධක හමුවී ඇත. එමෙන්ම ග්‍රීක රෝම අවධියේදීද බුදුන් වහන්සේ දර්ශනය තුළද සාමූහිකත්ව සංකල්පය පැවති බව පෙනී යයි.

නූතන යුගයට සාපේක්ෂව ගෝත්‍රික අවධියේදී මිනිසාගේ අවශ්‍යතා සීමිත විය. ගෝත්‍රික අවධියේදී වෙනත් ආර්ථික අවශ්‍යතා නොවුනත් ආහාර සපයා ගැනීමේ අවශ්‍යතාවයක් විය. ගෝත්‍රික අවශ්‍යතා ඉටුකර ගැනීමට සාමූහිකව ඒකරාශි වී කටයුතු කළ බව පෙනේ. පැරණි ගෝත්‍රික සමාජ ක්‍රමය තුළ පැවතුනේ සාමූහික චින්තන ක්‍රමයකි. ගෝත්‍රයේ පැවැත්මටත්, ආරක්ෂාව සපයා ගැනීමටත්, එකිනෙකාගේ සහයෝගය උදව් අවශ්‍ය විය. එය ඉපැරණි සමුපකාර සමාජය වූයේය.

එඬේර යුගය පිළිබඳව අවධානය යොමු කිරීමේදී වාසභූමි ඇතිකර ගැනීමේත් අනතුරුව වනසතුන් හා වෙනත් බාහිර උවදුරුවලින් මිදීමට සාමූහිකව ජීවත්වීමට පුරුදු විය. මෙම අවධියේදී ලැබූ අත්දැකීම් පදනම් කරගත සාමූහිකව ජීවත්වීමේ ගුණධර්මය, මිනිසා කෘෂිකාර්මික ජීවිතයට හුරුවීමත් සමඟම තවදුරටත් වර්ධනය විය.

ශිෂ්ඨාචාර අවධියේ සිටම සමාජය දියුණුවත්ම මිනියා සාමූහිකව කටයුතු කිරීමට පුරුදු විය. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ සමුපකාර ක්‍රමය දෙස අවධානය යොමු කිරීමේදී, එහි ආභාෂය යුරෝපියන්ගෙන් ලද දායාදයක් ලෙස සලකනු ලැබේ. එහෙත් ශ්‍රී ලංකාවේ ඈත අතීතය දෙස අවධානය යොමු කරන විට එහි සමුපකාර්ක අදහස් පැවති බව පෙනේ. බුදුදහමින් පෝෂණය වූ ශ්‍රී ලාංකික ගැමි සමාජය තුළ අන්‍යොන්‍ය සුහදත්වය, එකමුතුකම, සමානත්වතාවය වැනි අදහස් අතීතයේ සිටම පැවති බව පැහැදිලි කරුණකි.

ලංකාවේ ආර්යයන්ගේ ජනපද කෘෂිකාර්මික ස්වරූපයක් ගනු ලැබීය. මුල්ම ජනාවාසය ක්‍රි. පූ. 5 වෙනි ශතවර්ෂයේදී සංක්‍රාමික ආර්ය නායකයින් විසින් පිහිටුවන ලද ගම් කිහිපයකි. කෘෂි කාර්මික දිවිපෙවෙතකට හුරුවූ ජනකොටස් අන්‍යෝන්‍ය සුහදත්වය සහ සහජීවනය මත සිය කෘෂිකාර්මික කටයුතු සිදු කළහ. විශේෂයෙන්ම අතීත ලංකාවේ වාර්කටයුතු ඉතා සාර්ථකව ඉටුකර ගැනීමට හැකි විය. එලෙස සාමූහිකව එකට එකතු වී කටයුතු කිරීමට පුහුණුවක් ඔවුන් නිතැතින්ම ලබා ගත් අතර, ඒ තුළින් ඔවුහු සමුපකාර් ගුණාංග වර්ධනය කර ගත්හ.

කෘෂි කටයුතු හැරණු විට මනා කළමනාකරණයකින් හා සාමූහිකව කටයුතු කිරීමෙන් ඉදිකළ වෙහෙර විහාර දාගැබ් හා විශාල වැව් අදත් දක්නට ඇත. වැඩවසම් ක්‍රමය යටතේ හෝ වහල් මෙහෙය මගින් සිදුවූවක් යයි යමෙකුට තර්කයන් ඉදිරිපත් කළ හැකි වුවත් අතීත ලංකාවේ ඉතිහාසය දෙස අවධානය යොමු කිරීමේදී මෙම ඉදිකිරීම් සාමූහිකත්වයෙන් යුක්තව ඉදිකළ බව පැහැදිලිය. මෙයින් පෙනී යන්නේ සාමූහිකත්ව සංකල්පය ගොඩ නැගීමට ආර්ථිකමය කරුණු පමණක් හේතු නොවන බවය. "අත්තම්" ක්‍රමය තුළ පවා අසල්වැසියාට ස්වේච්ඡාවෙන් උදව් කිරීම ඈත අතීතයේ සිටම පැවත එන්නකි. තට්ටුමාරු, කට්ටිමාරු වැනි ගොවිතැන් මාරුවීමේ ක්‍රමවලදීද සාමූහික හැඟීම් ක්‍රියාත්මක වූ බව පෙනී යයි. පිංකම් බිලිතොවිල් ගම්මඩු සහ ගම්මුන්ගේ ආගමික සංස්කෘතික කටයුතු වල සමුපකාර හැඟීම දනවන අවස්ථා ඇති බැවිද මෙම හැඟීම ශ්‍රී ලංකාවේ ගැමි ජීවිතයේ මූලික අංගයක් බවද පෙනෙයි.

රජරට රාජධානි බිඳ වැටීමත් සමගම නිර්තදිගට රාජධානි සංක්‍රමණය වීමෙන් පසු වුවද මෙරට ජනයා සමුපකාර්ක හැඟීම් අමතක නොකලහ. මේ තත්වය වඩාත් අවබෝධ වන්නේ ලංකාවේ අවසන් රාජධානිය වූ මහනුවර රාජධානියේ පැවති සමුපකාර්ක ගුණාංග දෙසට අවධානය යොමු කිරීම තුළිනි.

මහනුවර අවධියේ වැඩවසම් සමාජ රටාවක් පැවතියත් එය ක්‍රියාත්මක වීමේ දී එකිනෙකා මත අවබෝධයකින් ක්‍රියාකළ බව පෙනේ. විශේෂයෙන්ම කෘෂි කාර්මික වැඩ වලදී මෙන්ම සමාජ රටාව තුළද සාමූහිකත්ව ගුණධර්මයන් පැවති බවට වාර්තා හමුවේ. රොබට්නොක්ස්ගේ "එදා හෙළදිව" ග්‍රන්ථයේ සඳහන් කරන ආකාරයට මහනුවර අවධියේ කෘෂි කාර්මික රටාව තුළ කටයුතු කිරීමේ දී සියළු දෙනා සාමූහිකව කටයුතු කළ බව පෙනී යයි. වී වැපිරීම, ගොයම් කැපීම වැනි අවස්ථාවලදී සාමූහිකව කටයුතු කළ බව කීමට පිළිවන. කෘෂි කාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය ලබා ගන්නේ "දියබෙදුම්" නම් ක්‍රමයක් යටතේය. එහිදී වුවද ක්‍රමානුකූලව ජලය කුඹුරුවලට ලබා ගනිමින් අන්‍යොන්‍ය සුහදත්වය ඔවුන් පෙන්විය. මෙලෙස බැලීමේදී පැහැදිලි වන්නේ රාජකාර් ක්‍රමය යටතේ වුවද මහනුවර සමයේදී සාමූහිකත්ව ගුණධර්ම ආරක්ෂා වී පැවති බවය.

**මහනුවර අවධියේ වැඩවසම් සමාජ රටාවක් පැවතියත් එය ක්‍රියාත්මක වීමේ දී එකිනෙකා මත අවබෝධයකින් ක්‍රියාකළ බව පෙනේ. විශේෂයෙන්ම කෘෂි කාර්මික වැඩ වලදී මෙන්ම සමාජ රටාව තුළද සාමූහිකත්ව ගුණධර්මයන් පැවති බවට වාර්තා හමුවේ.රොබට්නොක්ස්ගේ "එදා හෙළදිව" ග්‍රන්ථයේ සඳහන් කරන ආකාරයට මහනුවර අවධියේ කෘෂි කාර්මික රටාව තුළ කටයුතු කිරීමේ දී සියළු දෙනා සාමූහිකව කටයුතු කළ බව පෙනී යයි.**

මේ අනුව පැහැදිලි වන්නේ සමුපකාර ව්‍යාපාරයෙහි මුඛ්‍ය අර්ථය වූ සමුපකාරය (සාමූහිකත්වය) යන්න මෙරට ජනතාවට නව අත්දැකීමක් නොව ඈත අතීතයේ සිටම දායාදයක් ලෙස හිමිවූ තත්වයකි. ඒ වගේම සණස සමිති වල ප්‍රධාන තේමාව වූ "සකසුරුවම" ජනතාවගේ එදිනෙදා ජීවිතය තුළ නිරන්තරයෙන් දක්නට ලැබුණු තත්වයකි. එවැනි පසුබිමක් තුළ "සමුපකාරය ක්‍රමයකට" හෝ "සකසුරුවම්" ක්‍රමයකට ජනතාව හුරු කිරීම ආයාසයකින් තොරව සිදු වූ බැවින් වර්තමාන සමාජය තුළ ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ලැබූ සංවිධාන නවයක් ලෙස සමුපකාරය හඳුනා ගත හැකි වේ.

**අජිත් තල්වත්ත**
ගුරුගම - මුරුතලාව